සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

11 ශ්‍රේණිය | පැය 3 යි

නම/ විභාග අංකයඃ.................................................................................................................................

I කොටස

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**
* **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන තුළින් 2020 රන් සම්මානය දිනාගත් සඳගලතැන්න විද්‍යාලය වෙනුවෙන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, පාසලේ ආදි ශිෂ්‍ය සංගමය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය එක්ව දේශීය ඖෂධ අඩංගු ප්‍රතිශක්තිකරණ පානයක් පාසල තුළ සකස් කොට මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අධීක්ෂණය යටතේ සතියේ දින 03 ක් සිසුන්ට ලබාදීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ.

1. සඳගලතැන්න විද්‍යාලය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
   (1) ආහාර (2) සෞඛ්‍යය
   (3) අධ්‍යාපනය (4) ආරක්ෂාව

2. සඳගලතැන්න විද්‍යාලය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
   (1) රාජ්‍ය සංස්ථාය (2) රජයේ දෙපාර්තමේන්තුව
   (3) රාජ්‍ය සමාගම්ය (4) සංස්ථාපති සමාගම්ය.

3. මෙහිදී ආයුර්වේද දෙපාර්තමේන්තුව සකස් කළ ඖෂධ පානය අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ,
   (1) භූමිය (2) ශ්‍රමය
   (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

4. ඉහත සිද්ධිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ආයුර්වේද දෙපාර්තමේන්තුව පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතනයකි.
   (2) පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය එම විද්‍යාලයේ ඇල්මැති පාර්ශවයකි.
   (3) ඖෂධීය පානය සකස් කිරීමට යොදා ගන්නා භාජන ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකයට අයත් වේ.
   (4) සඳගලතැන්න විද්‍යාලයේ සිසුන් එම විද්‍යාලයේ බාහිර පරිසර සාධකයකි.

5. සිද්ධියට අදාළ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අධීක්ෂණය යන්න අයත්වන පරිසර සාධකය වන්නේ,
   (1) දේශපාලන පරිසරය (2) තාක්ෂණික පරිසරය
   (3) ආර්ථික පරිසරය (4) නෛතික පරිසරය

6. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදිව වර්ග කර ඇති පිළිතුර තෝරන්න.
   (1) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
   (2) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ ව්‍යාපාර
   (3) රාජ්‍ය අංශයේ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
   (4) ලාභ අරමුණු කරගත් ව්‍යාපාර, පෞද්ගලික අංශයේ ව්‍යාපාර

7. රංග සහ එරංග පෙදරේරු කර්මාන්තය සම්බන්ධයෙන් නිපුණයෝ වෙති. තමන් සතු ප්‍රාග්ධනය පමණක් යොදා සිය වෘත්තීය හැකියාව ව්‍යාපාරයක් බවට පත් කිරීමට අදහස් කරති. මොවුන් දෙදෙනාට වඩාත් ගැලපෙන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) සංස්ථාපිත සමාගම් (2) ඒක පුද්ගල ව්‍යාපාර

(3) හවුල් ව්‍යාපාර (4) සමිති සංවිධාන

8. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් වන්නේ,

(1) නීතිමය පුද්ගලභාවයක් ලැබීම (2) අඛණ්ඩ පැවැත්මක් ලැබීම

(3) ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම (4) වගකීම සීමිත වීම.

9. පහත දැක්වෙන්නේ චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවකි.

015630 7010 055 0072497694

A B C D

ඉහත A හා D අක්ෂර වලින් දැක්වෙන නිවැරදි අංක ඇතුළත් පිළිතුර වන්නේ,

(1) බැංකු ගිණුම් අකය හා ශාඛා අංකයයි.

(2) බැංකුවේ අංකය හා බැංකු ගිණුම් අංකයයි.

(3) චෙක්පත් අංකය හා බැංකුවේ අංකයයි.

(4) චෙක්පත් අංකය හා බැංකු ගිණුම් අංකයයි.

10. ව්‍යාපාරයකට බැංකු ජංගම ගිණුමක් පවත්වා ගැනීමෙන් සිදුවන වාසියක් නොවන්නේ මින් කුමක්ද?

(1) ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

(2) ණයපත් මගින් ගනුදෙනු කළ හැකිවීම.

(3) බැංකු අයිරා පහසුකම් ලබාගත හැකිවීම.

(4) චෙක්පත් මගින් ගෙවීම් කළ හැකිවීම.

11. සකුරා බතික් ව්‍යාපාරය පවත්වා ගෙනයන සපුමලී තමා සතු වූ රක්ෂණ ඔප්පුවක් ඇපයට තබා නිවාස ණයක් ලබාගන්නා ලදී. සපුමලී ණය මුදල ලබාගැනීමට භාවිතා කළේ,

(1) ජීවිත රක්ෂණ ඔප්පුවකි (2) ගිනි රක්ෂණ ඔප්පුවකි.

(3) මාර්ගස්ථ මුදල් රක්ෂණ ඔප්පුවකි. (4) මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි.

12. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පහත දැක්වේ.

A මාධ්‍යය B ලබන්නා

C ප්‍රතිපෝෂණය D පණිවුඩය

E යවන්නා F ප්‍රතිචාරය

සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නිවැරදි පිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) E D A B F C (2) E D A B C F

(3) E A D B F C (4) E D A F B C

13. භාණ්ඩ විකිණීමේදී බොහෝ විට ලකුණු කල මිලටම විකිණීම ..............(1)................ දක්නට ලැබෙන අතර වෙළෙඳ වට්ටම ලබාදීම ................ (2)................. බහුලව දක්නට ලැබේ.

(1) හා (2) ස්ථානවලට අදාළ නිවැරදි පිළිතුරු අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) තොග වෙළෙඳමේදී, සිල්ලර වෙළඳමේදී

(2) සිල්ලර වෙළෙඳමේදී, ආනයන වෙළඳමේදී

(3) සිල්ලර වෙළෙඳමේදී, තොග වෙළඳමේදී

(4) තොග වෙළෙඳමේදී, ආනයන වෙළඳමේදී

14. සාරංගා පොත් ප්‍රකාශකයෝ විසින් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන භූමියේ ප්‍රධාන පිවිසුම් දෙරටුව අසලින් තමාගේ වෙළඳ කුටිය වෙන්කළ ගැනීමට තීරණය කර සේවකයෙකු ද බඳවා ගත්තේ ය.

මෙම සිද්ධියේ ඇතුළත් කළමනාකරණ කාර්යයන් දෙක වන්නේ,

(1) සැලසුම්කරණය හා මෙහෙයවීමයි

(2) සැලසුම්කරණය හා සංවිධානකරණයයි.

(3) සංවිධානකරණය හා පාලනයයි.

(4) මෙහෙයවීම හා සංවිධානකරණයයි.

15. අලෙවිකරණ මිශ්‍රණයට අදාළ විචල්‍යයන් X තීරුවේද ඊට අදාළ අයිතමයන් කිහිපයක් Y තීරුවේද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. නිෂ්පාදිතය | A පෞද්ගලික විකුණුම්, මහජන සම්බන්ධතා |
| 2. මිල | B ගුණත්වය, ඇසුරුම |
| 3. ස්ථානය | C වට්ටම්, දීමනා |
| 4. ප්‍රවර්ධනය | D ප්‍රවාහනය, ආවරණ ප්‍රදේශ |

X හා Y තීරු අනුපිළිවෙළින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වනුයේ,

(1) BCDA

(2) BCAD

(2) DCDA

(4) DCAD

(16) කොටස් වෙළෙඳපොල කටයුතු අධීක්ෂණය සහ විධිමත් කිරීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනය වන්නේ,

(1) ශ්‍රී ලංකා මහ බැංකුව

(2) කොළඹ කොටස් හුවමාරුව

(3) බලපත්‍රලාභී වාණිජ බැංකු

(4) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

(17) ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි ගනුදෙනු, ගිණුම් පොත්වල සටහන් කර වර්ග කර, මූල්‍ය වාර්තා පිළියෙල කර අවශ්‍ය පාර්ශවවලට තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය හඳුන්වන නාමය වන්නේ,

(1) මූල්‍ය ප්‍රකාශ

(2) ගිණුම්කරණ සමීකරණ

(3) ද්විත්ව සටහන් ක්‍රමය

(4) ගිණුම්කරණය

18. "රු. 50000 ක් වූ බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම" යන ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ

(1) වගකීම් පමණක් වෙනස් වේ.

(2) වත්කම් පමණක් වෙනස් වේ.

(3) වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ.

(4) වත්කම්, වගකීම් හා හිමිකම් වෙනස් වේ.

19. කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම පහත දැක්වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

200000 = 150000 + 50000

අයිතිකරු රු. 50000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමෙන් පසු ඉහත ගිණුම්කරණ සමීකරණයෙහි අගයන් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 250000 | = | 150000 | + | 100000 |
| (2) | 200000 | = | 150000 | + | 50000 |
| (3) | 150000 | = | 100000 | + | 50000 |
| (4) | 150000 | = | 150000 | + | - |

20. ණයගැතියෙකුගේ රු. 30000 ක් වූ ගිණුම පියවීම සඳහා රු. 25000 ක් මුදලින් ලැබීම යන ගනුදෙනුවට අදාළ අසම්පූර්ණ ද්විත්ව සටහන පහත දැක්වේ.

| | |
|---|---|
| මුදල් ගිණුම හර | රු. 25000 |
| 1. ......................... ගිණුම හර | 2. ............................. |
| ණයගැති ගිණුම බැර | 3. ............................. |

ඉහත (1), (2), (3) යන ස්ථානවලට අදාළ නිවැරදි අයිතම පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) දුන් වට්ටම්, රු. 5000 හා රු. 30000

(2) ලද වට්ටම්, රු. 5000 හා රු. 30000

(3) දුන් වට්ටම්, රු. 5000 හා රු. 25000

(4) ලද වට්ටම, රු. 5000 හා රු. 25000

21. ව්‍යාපාර ගනුදෙනු නිසා ඇතිවන, ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ලබාදෙන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් හඳුන්වන්නේ,

(1) හිමිකම් (2) වගකීම් (3) වත්කම් (4) ආදායම්

22. ව්‍යාපාරයක් රු. 5000 ක රක්ෂණ ගාස්තු මුදලින් ගෙවීම, සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මුදල් පොත, ගෙවීම් වවුචරය (2) ගෙවීම් වවුචරය, සුළු මුදල් පොත

(3) ජර්නල් වවුචරය, මුදල් පොත (4) ගෙවීම් වවුචරය, මුදල් පොත

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **23** හා **24** ට පිළිතුරු සපයන්න.

2020 ජුනි 30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 16100 ක් විය. පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.

A. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 9000 කි.

B. බැංකුවට සෘජුවම ලැබී ඇති ණය ගැති ප්‍රේෂණ රු. 3500 කි.

C. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 3000 කි.

23. ඉහත හේතු අතුරෙන් බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩිවීමට බලපෑවේ,

(1) A හා C පමණි (2) A පමණි

(3) B හා C පමණි (4) B පමණි

24. 2020 ජුනි 30 දිනට සංශෝධිත බැංකු ශේෂය

(1) රු. 19600 කි. (2) රු. 16600 කි

(3) රු. 7100 කි. (4) රු. 13100 කි.

25. ණය හිමියෙකුට ගෙවූ රු. 1,5000 ක චෙක්පත අගරු විය. මේ නිසා ව්‍යාපාරයේ

(1) බැංකු ශේෂය අඩුවන අතර ණය හිමි ශේෂය අඩුවේ.

(2) බැංකු ශේෂය වැඩි වී ණය හිමි ශේෂය අඩුවේ.

(3) බැංකු ශේෂය අඩු වී ණය හිමි ශේෂය වැඩිවේ.

(4) බැංකු ශේෂය වැඩිවන අතර ණය හිමි ශේෂය ද වැඩිවේ.

26. ලිපිද්‍රව්‍ය ව්‍යාපාරයක මූලික පොත් වල සටහන් කර තිබූ ගනුදෙනු දෙකක් පහත දැක්වේ.

A සිංහ ලී බඩු වෙළෙඳුන්ගෙන් රු. 40000ක ලී බඩු ණයට ගැනීම

B රු. 25000 ක ලිපිද්‍රව්‍ය තොගයක් ජයමාල්ට ණයට විකිණීම

ඉහත A හා B ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේදී භාවිතාකළ මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගැනුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය (2) ගැනුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය

(3) ජ'ර්නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය (4) ජර්නල් වවුචරය, ගැනුම් ඉන්වොයිසිය.

27. බේකරි නිෂ්පාදන ව්‍යාපාරයක අයිතිකරු වන කිත්සිරි පාන් රාත්තල් 25 ක් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගැනීම සටහන් කරන මූලික සටහන් පොත වනුයේ,

(1) පොදු ජ'ර්නලයයි. (2) ගැනුම් ජර්නලයයි.

(3) විකුණුම් ජ'ර්නලයයි. (4) සුළු මුදල් පොතයි.

28. සහන්ගේ ව්‍යාපාරයේ ණයහිමියෙකු වූ පවන්ට රු. 20000 ක ණය මුදලක් ගෙවීමේදී 5%ක වට්ටමක් හිමි වී ඇත. මෙය සහන්ගේ ව්‍යාපාරයේ,

(1) රු. 20000 ක දුන් වට්ටමකි. (2) රු. 20000 ක ලද වට්ටමකි

(3) රු. 1000 ක දුන් වට්ටමකි (4) රු. 1000 ක ලද වට්ටමකි.

29. ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු. 250000 ක් වූ අතර බැර පැත්තේ එකතුව රු. 245000ක් විය. මෙම වෙනස නිසා ව්‍යාපාරයේ අවිනිශ්චිත ගිණුමේ,

(1) රු. 5000ක හර ශේෂයක් පවතී. (2) රු. 5000 ක බැර ශේෂයක් පවතී

(3) රු. 245000 ක හර ශේෂයක් පවතී. (4) රු. 2500000 ක බැර ශේෂයක් පවතී.

**පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 30 හා 31 ට පිළිතුරු සපයන්න.**

සත්සර ක්‍රීඩා සමාජයේ 2020.01.01 දිනට සිටි සාමාජික සංඛ්‍යාව 200 කි. එක් අයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2020 වර්ෂය තුළ දී සාමාජිකයින් 30 දෙනෙකු වර්ෂයට අදළ සාමාජික මුදල් ගෙවා නැත.

30. 2020 වර්ෂයේ ලැබීම හා ගෙවීමේ ගිණුමේ ඇතුළත් කළයුතු සාමාජික මුදල කොපමණද?

(1) රු. 120 000 කි. (2) රු. 10 000 කි.

(3) 102 000 කි. (4) රු. 18 000 කි.

31. 2020 වර්ෂය සඳහා ආදයම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

(1) රු. 120 000 කි. (2) රු. 102 000 කි.

(3) රු. 10000 කි. (4) රු. 18000 කි.

32. මුද්‍රණ ආයතනයක් මුද්‍රණ අංශයේ විදුලිබිල සඳහා දරන ලද රු. 8000 අයත් වන්නේ,

(1) ඍජු ද්‍රව්‍ය පිරිවැයටයි. (2) ඍජු වෙනත් පිරිවැයටයි.

(3) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයටයි. (4) ඍජු ශ්‍රම පිරිවැයටයි.

33. පාසල් බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක 2020 නොවැම්බර් මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය රු. 360, 000කි. මාසය තුළ දී නිෂ්පාදනය කළ පාසල් බෑග් ගණන 600කි. බෑගය නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභාන්තිකයක් තබා ගත්තේ නම් එක් බෑගයක විකුණුම් මිල කොපමණ ද?

(1) රු. 360 (2) රු. 600 (3) රු. 625 (4) රු. 750

34. 2020.01.01 දින රු. 600000 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගත් අතර එහි ඵලදයී ජීවිත කාලය වර්ෂ 5කි. එම කාලය අවසානයේ යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 100000 කි. 2020. 12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ක්ෂය ප්‍රමාණය කොපමණ ද?

(1) රු. 120 000 (2) රු. 200000 (3) රු. 100000 (4) රු. 240000

**පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සුමුදුගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට පිළියෙල තල ශේෂ පිරික්සුමෙන් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | (රු) |
|---|---|
| ප්‍රාග්ධනය | 400000 |
| තොගය (2020.01.01 දිනට | 50000 |
| විකුණුම් | 350000 |
| ගැනුම් | 250000 |
| ගෙනඒමේ කුලී | 4000 |
| ණය ගැතියෝ | 45000 |
| රක්ෂණ වියදම් | 20000 |
| පරිපාලන වේතන | 30000 |
| මූල්‍ය වියදම් | 6000 |
| ලද වට්ටම් | 4000 |
| වෙනත් ආදයම් | 8000 |
| දුන් වට්ටම් | 15000 |

අතිරේක තොරතුරු

* 2020 වර්ෂය සඳහා රක්ෂණ ගාස්තුව රු. 25000කි.

* ණය ගැතියන්ගෙන් රු. 6000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

* 2020. 12.31. දිනට ඉතිරි තොගය රු. 60000 කි.

35. 20202.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය

(1) රු. 193 000 කි. (2) රු. 244000 කි

(3) 163 000 කි. (4) රු. 304000 කි.

36. සුමුදුගේ ව්‍යාපාරයේ 20202.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය

(1) රු. 106000කි (2) රු. 2444000 කි

(3) රු. 304000කි. (4) රු. 254000 කි.

37. මෙම ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්සය තුළ දී මුදල් ගෙවා ඇති රක්ෂණ ගාස්තුව

(1) රු. 5000කි. (2) රු. 25000 කි.

(3) රු. 30000 කි. (4) රු. 20000 කි.

38. සුමුදුගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය

(1) රු. 82000 කි. (2) රු. 118000 කි.

(3) රු. 36000 කි. (4) රු. 106000 කි.

39. මෙම ව්‍යාපාරයේ 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ණයගැති වටිනාකම

(1) රු. 45000 කි. (2) රු. 39000 කි.

(3) රු. 6000 කි. (4) රු. 51000 කි.

40. 2020.12.31 දිනට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ මුළු හිමිකම කොපමණ ද?

(1) රු. 436000 කි. (2) රු. 400000 කි.

(3) රු. 364000 කි. (4) රු. 506000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

11 ශ්‍රේණිය

නම/ විභාග අංකය:.............................................................................................................................

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක වන ජයනී මොණරාගල ප්‍රදේශයේ පදිංචිව සිටියි. තම ප්‍රදේශයේ කහ වගා කරන ගොවීන්ගේ අස්වැන්න සඳහා හොඳ වෙළෙඳපොලක් නොමැතිවීම තුළින් ගොවීන් නගන දුක්ගැනවිලි රූපවාහිනිය නැරඹීමේදී ඇයට දැකගත හැකිවිය. තමාගේ මිතුරෙකු වන මිණිමුතු ද සම්බන්ධ කර ගනිමින් ප්‍රදේශයේ ගොවීන්ගේ කහ අස්වනු සාධාරණ මිලකට මිලදීගෙන කහ කුඩු පැකට් වශයෙන් සකසා සිල්ලර, තොග හා සුපිරි වෙළෙඳසැල්වලට සැපයීමේ ව්‍යාපාරයක් 2020.01.01 දින "ජයමිණි ප්‍රොඩක්ට්" නමින් ආරම්භ කරන ලදී. ජයනී සහ මිණිමුතු රු. 100000 බැගින් සහ වාර්ෂිකව පොලී අනුපාතය 6% ක් වූ 200000 ක ණය මුදලක්ද යොදවන ලදී. 2020.01.04 දින රු. 200000 කට පාවිච්චි කළ කුඩා ලොරි රථයක්ද මිලදී ගත්තේ ය.

2020.01.31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදුවිය.

| | රුපියල් |
|---|---:|
| කහ ගොවීන්ගෙන් අත්පිට ගැනුම් | 50000 |
| ණයට ගැනුම් | 15000 |
| කහ ඇඹරීමේ යන්ත්‍රයක් මිලට ගත්තා | 1, 25000 |
| ප්‍රවාහන වියදම් | 3000 |
| රියදුරු වැටුප් ගෙව්වා | 15000 |
| විකුණුම් අත්පිට | 80000 |
| ණයට | 20000 |
| විදුලි ගාස්තු | 500 |

2020.01.31 දිනට පහත තොරතුරු සපයා ඇත.

* විදුලි ගාස්තු රු. 1500 ක් හා රියදුරු වැටුප් 5000 ක් ගෙවිය යුතුව ඇත.

* ලොරි රථය වාර්ෂිකව 12% බැගින් සරල මාගී ක්‍රමයට ක්ෂය කරයි.

* කොළඹ පැවති කෘෂිභෝග වෙළෙඳ ප්‍රදර්ශනයේදී "ජයමිණි ප්‍රොඩක්ට්" ව්‍යාපාරයේ නිෂ්පාදන සඳහා විදේශීය ඇණවුම් කිහිපයක් ද ඉදිරිපත් වුණි.

ඉදිරි කාලයේදී ඉඩමක් මිලදී ගෙන තමන් සතු කහ වගාවන්ද ඇරඹීමට "ජයමිණි ප්‍රොඩක්ට්" තීරණය කර ඇත.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් "ජයමිණි ප්‍රොඩක්ට්" ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(ආ) එම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ දැකිය හැකි වාසි දෙකක් ලියන්න.

(ii) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් දෙකක් හා අවස්ථාවන් දෙකක් සඳහන් කරන්න.

(iii) (අ) පහත සඳහන් ප්‍රකාශ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් වේද?

1. කහ කුඩු පැකට් නිෂ්පාදනය කිරීම

2. කොළඹ පැවති කෘෂිභෝග වෙළඳ ප්‍රදර්ශනයට කහ කුඩු පැකට් ඉදිරිපත් කිරීම

(ආ) සිද්ධියේ සඳහන් දේශීය වෙළෙඳාමේ ප්‍රභේද දෙක දක්වන්න.

(iv) මෙම සිද්ධියේ සඳහන් වන සැලසුම්කරණ කාර්ය සඳහා නිදසුනක් සහ සංවිධානකරණ කාර්ය සඳහා නිදසුනක් බැගින් ලියන්න.

2020.01.01 දිනට "ජයමිණි ප්‍රොඩක්ට්" ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා කෙරෙන මූලික සටහන් පොත් දෙකක් ලියන්න.

(vii) 2020.01.31 දිනට ජයමිණි ප්‍රොඩක්ට් ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(viii) (අ) ජයමිනි ප්‍රොඩක්ට් ව්‍යාපාරයේ රියදුරු වැටුප් ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(අ) මෙම ව්‍යාපාරයේ 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙළ කරන ආදයම් ප්‍රකාශයේ දැක්විය යුතු මුළු රියැදුරු වැටුප් වටිනාකම කොපමණද?

මෙම ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

"ජයමිණි ප්‍රොඩක්ට් ව්‍යාපාරයේ 2020.01.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

2. (i) (අ) මිනිස් අවශ්‍යතාවක් යනු කුමක් ද?

(ආ) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ දෙකක් ලියන්න.?

(ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක සේවකයින්ගේ විශේෂඥ දැනුම එම ව්‍යාපාරයේ අවස්ථාවකි.

(ආ) නිෂ්පාදනයේදී භාවිතා කරන මිනිසා විසින්සකස් කර ඇති දෑ නිෂ්පාදන සාධකයක් වන ශ්‍රමය වේ.

(ඉ) සමූපකාර සමිති ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

(ඊ) නිෂ්පාදන ව්‍යාපාරයක සැපයුම්කරුවෝ එම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයකි.

(ලකුණු 02)

(iii) මිරිස්ස සංචාරක කලාපය ආශ්‍රිතව පදිංචි ජිනාදරී, සපුමලීගේ ද සහාය ඇතිව බතික් නිමි ඇඳුම් සකසා දේශීය හා විදේශීය සංචාරකයන්ට අලෙවි කරයි.

(අ) ජිනාදරීගේ ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන මෙම සිද්ධියේ සඳහන් පාර්ශව දෙකක් ලියන්න.

(ආ) ජිනාදරීගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඉහත සිද්ධියේ සඳහන් පාර්ශවයක් සඳහන් කර, එම පාර්ශවය ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුවක් ලියන්න.

(ලකුණු 02)

(iv) පහත දැක්වෙන්නේ ව්‍යාපාර නාම කිහිපයකි.

1. සෙවන උළු නිෂ්පාදකයෝ
2. රසාරා තල කැරලි
3. සිතාරා කොමියුනිකේෂන්
4. මිගාර රියදුරු පාසල

(අ) ඉහත එක් එක් ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව ලියන්න.

(ආ) ඉහත එක් එක් ව්‍යාපාරය නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන ව්‍යාපාර වර්ගය සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

3. (i) (අ) වෙළෙඳම යනු කුමක් ද?

(ආ) සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳම අතර දක්නට ලැබෙන මූලික වෙනස කුමක්ද?

(ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) අණකරු හා අණලදු වහයෙන් චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව ඇත්තේ දෙකක් පමණි.

(ආ) ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නොහැක.

(ඉ) ප්‍රතිපෝෂණය යන්න සන්නිවේදන ක්‍රියාවලිය තුළ තිබිය යුතු අනිවාර්ය මූලිකාංගයක් නොවේ.

(ඊ) බැංකු ගිණුමේ මුදල් පදනම් කරගෙන බැංකුවක් විසින් තම ගනුදෙනුකරුවන්ට නිකුත් කරන කාඩ්පත හරපතක් ලෙස හැඳින්වේ.

(ලකුණු 02)

iii. උදරගේ ව්‍යාපාරයට සොරුන්ගෙන් ඇති වූ අලාභය සඳහා රු. 500000 ක වන්දියක් ලබාදෙන බව අදාළ රක්ෂණ ආයතනය විසින් ඔහුට ලිපියකින් දන්වා ඇත

මෙම සිද්ධියේ සඳහන් සන්නිවේදන ක්‍රියාවලියට අදාළ යවන්නා, පණිවුඩය, මාධ්‍යය හා ලබන්නා වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

iv ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි හතරක් දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

4. (i) පුද්ගලයෙකුට සිය මුදල් ආයෝජනය කළහැකි ආයෝජනමාර්ග හතරක් නම් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍යද යන්න දක්වන්න.

(අ) සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනයන යනුවෙන් කළමනාකරණ කාර්යයන් හතරකි.

(ආ) ඉලක්ක වෙළෙඳපල යනු වුවමනා තෘප්තිමත් කිරීමට අපේක්ෂා කරන පාරිභෝගික කොට්ඨාසයයි.

(ඉ) අලෙවි මිශ්‍රයේ ස්ථානය යන්නට බෙදහැරීම ඇතුළත් නොවේ.

(ඊ) සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ලැබීමේ හිමිකමක් නැත. (ලකුණු 02)

(iii.) ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන උදරි විසින් අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ. ඊට අදළ කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන් ඉදිරියෙන් දක්වන්න.

| අනුගමනය කළ පියවරයන් | කළමනාකරණ කාර්යය |
|---|---|
| 1. නිමි ඇඳුම්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම | |
| 2. සමාලි සේවකයෙකු ලෙස බඳවා ගැනීම | |
| 3. නව මැෂින් දෙකක් ලබාගැනීමට තීරණය කිරීම | |
| 4. ඇඳුම් පිළිබඳ සමාලිට අවශ්‍ය උපදෙස් ලබාදීම | |

(ලකුණු 02)

iv. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

## II කොටස - ගිණුම්කරණය

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)**

5. i. (අ) ගිණුම්කරණයේ මූලික අරමුණ කුමක් ද?

(ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත ගනුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

(අ) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 5000 ක් ගැනීම.

(ආ) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 40000 ක පරිගණක යන්ත්‍රයක් පරිගණක සමාග මෙන් ණයට ගැනීම (ලකුණු 02)

(iii) සිතිර පරිගණක උපාංග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2020.01.01 දින ආරම්භ කරන ලදී. එදින සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 1. සිතිර ව්‍යාපාරයට මුදල් යෙදවීම | රු. 100000 |
| 2. ලී බඩු අත්පිට මුදලට ගැනීම | රු. 40000 |
| 3. ගොඩනැගිල්ලට මාසික කුලිය ගෙවීම | රු. 8000 |
| 4. බැංකු ණයක් ලබාගැනීම | රු. 75000 |
| 5. පරිගණක උපාංග ණයට ගැනීම | රු. 50000 |

අවශ්‍ය වන්නේ,

ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. පළමු ගනුදෙනුව සටහන් කර දක්වා ඇත.

| ගනුදෙනුව | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| | මුදල් | | ප්‍රාග්ධනය | | |
| 1 | + 100000 | = | + 100000 | + | - |
| 2 | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

(iv) කසුන් ව්‍යාපාරයේ මාර්තු මාසය සඳහා ලැබුණු සුළු මුදල් අග්‍රිමය රු. 2000 කි. 2020 මාර්තු මාසයේ සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ. ලෑ: 04

| දිනය | ව.අ. | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2020.03.04 | 01 | ගමන් වියදම් | 150 |
| 2020.03.08 | 02 | තැපැල් ගාස්තු | 60 |
| 2020.03.16 | 03 | සංග්‍රහ වියදම් | 240 |
| 2020.03.28 | 04 | කුලී රථ ගාස්තු | 200 |

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන්කිරිම හා 2020.03.31 දිනට සුළු මුදල්පොත තුලනය කර දැක්වීම

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

6. (i) බැංකු ප්‍රකාශය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාරයේ ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට අදළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 02)

(ii) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර විසින් පිළියෙළ කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුම හා ආදායම් ප්‍රකාශය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) මල්පෝච්චි නිෂ්පාදනය කරන පවන ව්‍යාපාරයේ 2020 අගෝස්තු මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| මල් පෝච්චියට පිරිවැය | රු. 50 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 25000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | රු. 80000 |
| ඍජු ද්‍රව්‍ය පිරිවැය | රු. 20000 |
| ඍජු වෙනත් වියදම් | රු. 15000 |

අවශ්‍ය වන්නේ

(අ) අගෝස්තු මාසය තුළ නිෂ්පාදනය කළ මල්පෝච්චි ගණන

(ආ) අගෝස්තු මාසය සඳහා ඍජු ශ්‍රම පිරිවැය (ලකුණු 04)

(iv) සුජීවගේ ව්‍යාපාරයේ 2020.09.30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 24000 විය. එහෙත් 2020 සැප්තැම්බර් මැසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂය හා නොගැලපුණි. වෙනසට හේතු පහත දැක්වේ.

* තැන්පත් කළ නමුත් සැප්තැම්බර් මාසය තුළ නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 7000

* බැංකුව කළ ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 8000

* නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත්නොවූ චෙක්පත් රු. 6000

අවශ්‍ය වන්නේ

(අ) 2020.09.30 දිනට බැංකු ගිණුම සංශෝධනය කිරීම

(ආ) 2020.09.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කිරීම (ලකුණු 04)

(මුළු ලකුණු 12)

7. (i) (අ) තනි පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මොනවාද?

(ආ) උපචිත වියදම් ගිණුම්ගත කිරීමට අදළ ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 02)

(ii) දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2020 වර්ෂයේ සිට සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200 කි. 2020 වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 20.01.01 ශේෂය | 15000 | ක්‍රීඩා උපකරණ ගැනුම් | 9000 |
| සමාජික මුදල් | 12000 | ක්‍රීඩා භූමි නඩත්තු වියදම් | 4000 |
| විවිධ පරිත්‍යාග | 3000 | විවිධ වියදම් | 1000 |
| | | ක්‍රීඩා උපදේශක ගාස්තු | 6000 |
| | | 12/31 ශේෂය ප/ගෙ | 10000 |
| | 30000 | | 30000 |
| ශේෂය ඉ/ගෙ | 10000 | | |

අවශ්‍ය වන්නේ

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිලෙන තරු ක්‍රීඩා සමාජයේ ආදයම් ප්‍රකාශය

(ලකුණු 02)

(iii) පරාක්‍රම ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ගොඩනැගිලි (පිරිවැයට) | 5 50 000 | |
| ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම (2020.01.01 දිනට) | | 60000 |
| තොගය (2020.01.01) | 25000 | |
| 9% බැංකු ණය | | 100000 |
| ගැනුම් | 160000 | |
| විකුණුම් | | 220000 |
| වේතන | 8000 | |
| ණය ගැතියෝ | 50000 | |
| ණය හිමියෝ | 29000 | |
| ලද වට්ටම් | | 2800 |
| දුන් වට්ටම් | 1000 | |
| ගෙනඒමේ කුලී | 1500 | |
| ගෙවූ බැංකු ණය පොලී | 800 | |
| බොල් ණය | 800 | |
| විදුලි ගාස්තු | 2000 | |
| මුදල් ශේෂය | 7000 | |
| ප්‍රාග්ධනය | | 400000 |
| | 809800 | 809800 |

අමතර තොරතුරු :

2020. 12.31 දිනට තොගය රු. 25000

ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 5% බැගින් ක්ෂයකෙරේ.

ණයගැයන්ගෙන් රු. 5000 ක් බොල්ණය ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

(අ) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

(ලකුණු 04)

(ආ) 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

11 ශ්‍රේණිය

## i පත්‍රය පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 1 | 21 | 3 | 31 | 1 |
| 02 | 2 | 12 | 1 | 22 | 4 | 32 | 3 |
| 03 | 3 | 13 | 3 | 23 | 1 | 33 | 4 |
| 04 | 2 | 14 | 2 | 24 | 2 | 34 | 3 |
| 05 | 4 | 15 | 1 | 25 | 4 | 35 | 2 |
| 06 | 2 | 16 | 4 | 26 | 3 | 36 | 1 |
| 07 | 3 | 17 | 4 | 27 | 1 | 37 | 4 |
| 08 | 3 | 18 | 2 | 28 | 4 | 38 | 3 |
| 09 | 4 | 19 | 3 | 29 | 2 | 39 | 2 |
| 10 | 2 | 20 | 1 | 30 | 3 | 40 | 1 |

1. (i) (අ) හවුල් ව්‍යාපාර (ලකුණු 01)

(ආ) පහසුවෙන් ආරම්භ කළ හැකිවීම

වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම

හවුල්කරුවන්ගේ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකිවීම

වගකීම බෙදීයාම

සාමූහික තීරණ ගත හැකිවීම

(1/2 x 2 = ලකුණු 01)

(ii) <u>ශක්තීන්</u>

ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජයනි හඳුරා තිබීම

දෙදෙනා සතු මූල්‍ය ශක්තිය

(1/2 x 2 = ලකුණු 01)

<u>අවස්ථා</u>

ප්‍රදේශ කහ ගොවීන් බහුලවීම

කොළඹ පැවති ප්‍රදර්ශනයට සහභාගි වීමට අවස්ථාව ලැබීම

(1/2 x 2 = ලකුණු 01)

(iii) (අ) 1. නිෂ්පාදිතය

2. ස්ථානය / ප්‍රවර්ධනය (ලකුණු 01)

(ආ) සිල්ලර වෙළෙඳාම, තොග වෙළෙඳාම (ලකුණු 01)

iv සැලසුම්කරණය - ඉඩමක් මිලදීගෙන තමන් සතු කහ වගාවක් ඇරඹීමට තීරණය කිරීම

(ලකුණු 01)

සංවිධානකරණය - ලොරි රථයක් මිලදී ගැනීම (ලකුණු 01)

රියදුරු මහතෙකු බඳවා ගැනීම (ලකුණු 01)

v.

| | | | |
|---|---|---|---|
| වත්කම් රු. | = හිමිකරු (රු.) | + | වගකීම් (රු.) |
| මුදල් | = ප්‍රාග්ධන | | |
| + 200000 | = + 200000 | + | - |
| මුදල් | = | | බැංකු ණය |
| + 200000 | = | | + 200000 |
| හෝ | | | |
| වත්කම් (රු) | = හිමිකම් (රු) | + | වගකීම් (රු) |
| 400000 | = 200000 | + | 200000 |

(ලකුණු 02)

vi. මුදල් පොත

ණයට ගැනුම් ජර්නලය

ණයට විකුණුම් ජර්නලය (1 x 2 = ලකුණු 02)

vii

මුදල් ගිණුම

| | රු. | | රු. | |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම 1/2 | 200000 | ලොරි රථ ගිණුම | 200000 | 1/2 |
| බැංකුණය ගිණුම | 200000 | ගැනුම් | 50000 | |
| විකුණුම් | 80000 | ඇඹරීමේ යන්ත්‍ර | 125000 | |
| | | ප්‍රවාහන වියදම් | 3000 | |
| | | රියදුරු වැටුප් | 15000 | |
| | | විදුලි ගාස්තු | 500 | |
| | | 01/31 ශේෂය ප/ගෙ | 87500 | ← 01 |
| | 480000 | | 480000 | |
| 02/01 ශේෂය ඉ/ගෙ | 87500 | | | |

ලකුණු 02

(viii) (අ) වැටුප් ගිණුම හර රු 15000

මුදල් ගිණුම බැර රු. 15000

(ආ) රු. 20000 (ලකුණු 02)

(ix)

ජයමිණි ප්‍රොඩක්ට් ව්‍යාපාරයේ

2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය

| | | රු. | රු. | |
|---|---|---|---|---|
| ආදායම් | | | | |
| අත්පිට විකුණුම් | 1/2 | 80000 | | |
| ණයට විකුණුම් | | 20000 | | |
| | | | 100000 | |
| අඩුකලා වියදම් | | | | |
| අත්පිට ගැනුම් | 1/2 | 50000 | | |
| ණයට ගැනුම් | | 15000 | | |
| ප්‍රවාහන වියදම් | | 3000 | | |
| රියදුරු වැටුප් | 1/2 | 2000 | | 1/2 |
| විදුලි ගාස්තු | | 2000 | | |
| ලොරි රථ ක්ෂය | | 2000 | | |
| | | | 92000 | |
| ශුද්ධ ලාභය | | | 8000 | |

ලකුණු 2

(x) රු. 198000

හෝ

200000 - 2000 = 198000 (ලකුණු 02)

2. (i) (අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දැ මිනිස් අවශතා වේ. (ලකුණු 01)

(ආ) අත්‍යවශ්‍ය නීම.

පොදුවීම

ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නොහැකි වීම

සීමිත බව (1/2 x 2 = ලකුණු 01)

ii. අ) අසත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) අසත්‍යයි (1/2 x 4 = ලකුණු 02)

iii. (අ) ජීනාදරී / අයිතිකරු

සපුමලී / සහායකයා (1/2 x 2 = ලකුණු 01)

| (ආ) <u>පාර්ශවය</u> | <u>උනන්දුවක් දක්වීමට හේතුව</u> |
|---|---|
| ජීනාදරී / අයිතිකරු | ● ප්‍රමාණවත් ලාභයක් ලැබීම |
| | ● ව්‍යාපාරයේ අනාගත වර්ධනය |
| | ● ආයෝජනයේ සුරක්ෂිතතාව |
| සපුමලී/ සහායකයා | ● සාධාරණ වැටුපක් ලබා ගැනීම |
| | ● රැකියාවේ සුරක්ෂිත බව |
| දේශීය විදේශීය සංචාරකයෝ | ● ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම |
| | ● නිෂ්පාදිත සාධාරණ මිලකට ලබා ගැනීම |
| පාර්ශවයකට ලකුණු 1/2 | හේතුවකට ලකුණු 1/2 |

iv. (අ) 1. නිවස 2. ආහාර 3. සන්නිවේදනය 4. අධ්‍යාපනය

(03 ක්හෝ 04 ක් නිවැරදි නම් (ලකුණු 01) 02 ක් නිවැරදි නම් (ලකුණු 1/2)

(ආ) 1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි

2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි

3. සේවා සැපයීමේ ව්‍යාපාරයකි

4. සේවා සැපයීමේ ව්‍යාපාරයකි.

(3 ක් හෝ 04 ක් නිවැරදි නම් ල. 01)

2 ක් නිවැරදි නම් (ලකුණු 1/2)

මුළු ලකුණු 08

3. (i) (අ) භාන්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීමයි. (ලකුණු 01)

(අ) සිල්ලර වෙළෙඳාමේ අරමුණ අවසාන පාරිභෝජනය සඳහා විකිණීම වන අතර තොග වෙළෙඳාමේ අරමුණ නැවත විකිණීම සඳහා භාණ්ඩ විකිණීමයි. (ලකුණු 01)

(ii) (අ) අසත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) සත්‍යයි. (ලකුණු 02)

(iii) යවන්නා - රක්ෂණ ආයතනය

පණිවුඩය - සොරුන්ගෙන් ඇති වූ අලාභය සඳහා රු. 500000 ක වන්දියක් ලබාදීම

මාධ්‍යය - ලිඛිත

ලබන්නා - උදර / ව්‍යාපාර හිමියා (ලකුණු 02)

(iv) 1. චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකිවීම

2. බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකිවීම

3. සෘජු ප්‍රේෂණ රැස් කිරීම

4. ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

5. බැංකු ප්‍රකාශය ලැබීම. (1/2 x 4= ල 02)

4. (i) 1. ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම

2. ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම

3. දේපළ මිලදී ගැනීම

4. කොටස්වල ආයෝජනය කිරීම

5. භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීම

6. තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම (1/2 x 4= ල 02)

(ii) (අ) සත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) අසත්‍යයි (ලකුණු 02)

(iii) 1. පාලනය

2. සංවිධානකර

3. සැලසුම්කරණය

4. මෙහෙයවීම (1/2 x 4 ලකුණු 02)

(iv) අරමුණු

අවදානම

ප්‍රතිලාභ (1 x 2 = 02) - මුළු ලකුණු 08

5. (i) (අ) ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ

ව්‍යාපාරයක පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමයි. (ලකුණු 01)

(ආ) 1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම

2. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම

3. අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම (1/2 x 2 ලකුණු 01)

| | | | |
|---|---|---|---|
| (ii) (අ) | ගැනිලි ගිණුම හර | රු. 5000 | |
| | මුදල් ගිණුම බැර | රු. 5000 | (ලකුණු 01) |
| (ආ) | පරිගණක යන්ත්‍ර ගිණුම හර | රු. 40000 | |

ජේ.කේ. සමාගම බර රු. 40000 (ලකුණු 01)

(iii)

| ගනුදෙනුව | වත්කම් | = | හිමිකම් | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| 1 | මුදල් | = | ප්‍රාග්ධනය | | | |
| 2. | +100000 | = | +100000 | + | - | (1) |
| | මුදල් | | | | | |
| | - 40000 | = | - | | - | |
| | ලී බඩු | | | | | |
| 3. | +40000 | | | | | (1) |
| | මුදල් | = | ගොඩනැගිලි කුලී | + | - | |
| 4. | - 8000 | = | - 8000 | | | (1) |
| | මුදල් | = | - | + | බැංකුණය | |
| 5 | +75000 | = | - | | +75000 | (1) |
| | බඩු තොගය | = | - | + | ණය හිමියෝ | |
| | +50000 | | | | + 50000 | |

(1 බැගින් ලකුණු 4)

(iv) කසුන් ව්‍යාපාරය

2020 මාර්තු මාසය සඳහා සුළු මුදල් පොත

| ලැබීම් | ස. පි. | දිනය | විස්තරය | ව. අ. | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු: ගමන් වියදම් | තැපැල් ගාස්තු | සංග්‍රහ වියදම් | ලෙජර් ගිණුම | ලෙ.නි |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2000 (1/2) | | 20.03.01 | මුදල් පොත | | | | | | | |
| | | 20.03.04 | ගමන් වියදම් | 01 | 150 | 150 | | | | |
| | | 20.03.08 | තැපැල් ගාස්තු | 02 | (1/2) 60 | (1/2) | 60 | | | |
| | | 20.03.16 | සංග්‍රහ වියදම් | 03 | 240 | | | 240 | | |
| | | 20.03.28 | කුලී රථ ගාස්තු | 04 | 200 | 200 | | | | |
| | | | | | 650 | 350 | 60 | 240 | | |
| | | 20.03.31 | ශේෂය ප/ගෙ | | (1/2) 1350 | (1/2) | (1/2) | (1/2) | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 1350 (1/2) | | 20.04.01 | ශේෂය ඉ/ගෙ | | | | | | | |

ආකෘතියට 1/2

(ල. 04)

මුළු ලකුණු 12

6. (i) (අ) ජංගම ගිණුම් හිමියෙකුට අදාළ වාණිජ බැංකුව විසින් නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදුකළ ගනුදෙනු පිළිබඳව එවනු ලබන ප්‍රකාශයයි.

(ආ) බැංකු ගිණුම හර

මුදල් පොත බැර

(ලකුණු 02)

(ii) ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදයම් ප්‍රකාශය

| ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදයම් ප්‍රකාශය |
|---|---|
| මුදල් ලැබීම් හා ගෙවීම් සටහන්කරයි. | ආදයම් හාවියදම් පමණක් සටහන් කරයි. |
| මුදල් පොතට බොහෝදුරට සමාන වේ. | ලාභ හෝ අලාභ ප්‍රකාශයට බොහෝ දුරට සමාන වේ. |
| කාලඡේදය අවසානයේ අත ඉතිරි මුදල් ශේෂය පෙන්නුම් කරයි. | අතිරික්තය හෝ ඌනතාව පෙන්නුම් කරයි |
| මුදල් පදනමට පිළියෙල කරමි. | උපචිත පදනමට පිළියෙළ කරයි. |

(1 x 2 ලකුණු 02)

(iii) (අ) $\frac{80000}{50} = 1600$

(ආ) රු. 20000

(ලකුණු 04)

(iv) (අ)

බැංකු ගිණුම (සංශෝධිත)

| | රු. | | රු. |
|---|---|---|---|
| 2020.09.30 ශේෂය ඉ/ගෙ (1/2) | 24000 | ස්ථාවර නියෝග | 8000 (1/2) |
| | | 2020.09.30 ශේෂය ප/ගෙ | 16000 (1/2) |
| | 24000 | | 24000 |
| ශේෂය ඉ/ගෙ | 16000 | | |

(ලකුණු 02)

බැංකු සැසඳුම් ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| 2020.09.30 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය (1/2) | | 16000 |
| එකතු කළා :- | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් | 6000 | 6000 (1/2) |
| | | 22000 |
| අඩුකළා :- | | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | 7000 | (7000) (1/2) |
| | | 15000 |
| 2020.09.30 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය (1/2) | | |

(ලකුණු 02)

(මුළු ලකුණු 12)

(i) (අ) ආදායම් ප්‍රකාශය/ ලාභ හෝ අලාභ ප්‍රකාශය/ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය/ශේෂ පත්‍රය (ල.1)

(ආ) අදාළ වියදම් ගිණුම හර
අදාළ උපචිත වියදම් ගිණුම බැර (ල. 01)

(ii)

දිලෙන තරු ක්‍රීඩා සමාජය
2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

| | රු. | රු. | |
|---|---|---|---|
| ආදායම් | | | |
| සාමාජික මුදල් | 20000 | | |
| විවිධ පරිත්‍යාග | 3000 | 23000 | (1) |
| වියදම් | | | |
| ක්‍රීඩා භූමි නඩත්තු | 4000 | | |
| විවිධ වියදම් | 1000 | | |
| ක්‍රීඩා උපදේශන ගාස්තු | 6000 | (11000) | (1) |
| අතිරික්තය | | 12000 | |

(ල. 02)

(iii) (අ)

පරාක්‍රමගේ ව්‍යාපාරය
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශය (1/2)

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | 220000 |
| අඩුකලා - විකුණුම් පිරිවැය | | | |
| 2020.01.01 දිනට තොගය | | 25000 | |
| එකතු කළා ගැනුම් | 160000 | | |
| ගෙන ඒමේ කුලී | 1500 | | |
| | | 161500 | |
| විකිණීමට ඉදිරිපත්කළ භාණ්ඩ | | | |
| තොගයේ පිරිවැය | | 186500 | |
| අඩුකළා 2020.12.31 තොගය | | (25000) (1/2) | |
| විකුණුම් පිරිවැය | | | (161500) (1/2) |
| දළ ලාභය | | | 58500 (1/2) |
| එකතුකලා වෙනත් ආදයම් | | | |
| ලද වට්ටම් | | 2800 | 2800 |
| | | | 61300 |
| අඩුකළා වියදම් | | | |
| බෙදහැරීමේ වියදම් | | | |
| දුන් වට්ටම් | 1000 | | |
| බොල් ණය | 5800 (1/2) | 6800 | |
| පරිපාලන වියදම් | | | |
| ගොඩනැගිලි ක්ෂය | 27500 (1/2) | (1/2) | |
| වේතන | 8000 | | |
| විදුලි ගාස්තු | 2000 | 37500 | |
| මූල්‍ය වියදම් | | | |
| බැංකු ණය පොලී | 9000 | 9000 (1/2) | 53300 |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා (1/2) | | | 8000 |

(ල. 4)

(ආ)

පරාක්‍රමගේ ව්‍යාපාරය
2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (1/2)

| ජංගම නොවන වත්කම් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය (2) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ගොඩනැගිලි | 550000 | 87500 (1/2) | 462500 |
| | 550000 | 87500 | 4 62500 (1/2) |
| ජංගම වත්කම් | | | |
| 2020.12.31 තොගය | | 25000 | |
| ණය ගැතියෝ | | 45000 | |
| මුදල් | | (1/2) 7000 | 77000 |
| මුළු වත්කම් | | | 539500 |
| හිමිකම් | | | |
| ප්‍රාග්ධනය | | 400000 | |
| එකතු කළා ශුද්ධ ලාභය | | (1/2) 8000 | 408000 |
| ජංගම නොවන වගකීම් | | | |
| 9% බැංකු ණය | | | 100000 |
| ජංගම වගකීම් | | | |
| ණය හිමියෝ | | 27000 (1/2) | |
| උපචිත බැංකු ණය පොලී | | 4500 | 31500 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 539500 |

(ල. 4)

(මුළු ලකුණු 12)